මධ්‍යම සංස්කෘතික අරමුදලේ ගණුදෙනු වාර්තාව - 2024

මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2024 වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන 2024 වර්ෂයේ අරමුදලේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ පමණක් මෙම වාර්තාවේ දැක්වේ.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දැක්විය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වග බලා ගනු ලැබිය යුතුය.

1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

විගණන නිරීක්ෂණය	**කළමනාකරණයේ අදහස් දැක්වීම**	නිර්දේශය
2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදය මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි 877 (2) (ඇ) රෙගුලාසිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වර්ෂ 2 මාස 10 ක ප්‍රමාදයකින් 2026 මාර්තු 19 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණද 2023 සහ 2024 වර්ෂ වල මූල්‍ය ප්‍රකාශන 2025 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.	2022/2023 වර්ෂයේ ගිණුම්ද විගණනය වෙත ඉදිරිපත් කිරීමට සැලසුම් කර තිබේ. තවද, 2024 වර්ෂයේ අවසන් ගිණුම් පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන ඇත. 2025 වර්ෂයේ අවසන් ගිණුම්ද සකස් කිරීමට මේ වන විට කටයුතු ආරම්භ කර ඇති බව දන්වා සිටිමි.	චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය.

1.3 වත්කම්, වගකීම් අදායම් හා වියදම්.

අරමුදල විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වත්කම්, බැරකම් ආදායම් වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

මූල්‍ය ප්‍රකාශන අයිතමය	**වටිනාකම (රු)**
වත්කම්	
ජංගම වත්කම්	7,498,748,516
ජංගම නොවන වත්කම්	1,135,546,001
මුළු වත්කම්	8,634,294,518
වගකීම්	
ජංගම වගකීම්	267,233,287
ජංගම නොවන වගකීම්	1,398,317,150
මුළු වගකීම්	1,665,550,437
ස්කන්ධය	6,968,744,081
මුළු වගකීම් හා ස්කන්ධය	8,634,294,518
මුළු ආදායම	1,472,651,552
මුළු වියදම	1,491,643,175
ඌනතාවය	18,991,623

2. විගණන නිරීක්ෂණ

2.1 නීති රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති රීති , රෙගුලාසි ආදියට යොමුව	**අනුකූල නොවීම**	**කළමනාකරණයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	සෑම ඉන්ධන පරීක්ෂාවකින්ම මාස 12 ක කාලසීමාවකට පසුව හෝ කි.මී. 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව යන කාරණා අතුරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කල යුතු වුවත් අරමුදල සතු වාහන 172 ක් සඳහා ඉන්ධන දහන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි.	වාහන 122ක් සඳහා තෙල් පරීක්ෂාවක් සිදු කල යුතුය. නමුත් ආයතනය විසින් සාර්ථකව බහුල වශයෙන් ධාවනය වන කාර්, වෑන්, ත්‍රිවීල්, කැබ් යන වාහන 30ක පමණ ප්‍රමාණයකට තෙල් පරීක්ෂාවක් සිදුකර ඇත. ඉතිරි වාහනවල තෙල් පරීක්ෂාව ක්‍රමානුකූලව සිදු කරමින් පවතී.	චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාවන් කල යුතුය.
(ආ)	2022 ජනවාරි 25 දිනැති අංක 04/2022 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය	විගණනයට ඉදිරිපත් වූ වාහන ලේඛනය අනුව 2024 සැප්තැම්බර් මාසයේ වාහන වෙන්දේසියෙන් පසුවද වාහන 14ක් වෙන්දේසි කිරීමට ඇති /අබලන් තත්ත්වයේ පවතින ලෙස සඳහන් කර තිබුණි. එසේ වුවද වාහන අපහරණය කිරීම් ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට 2024 දෙසැම්බර් 31 දින තෙක් කටයුතු කර නොතිබුණි.	2024 වර්ෂයේ සැප්තැම්බර් මස ප්‍රසම්පාදනය මගින් එදිනට අබලි තත්ත්වයේ පැවති වාහන 07 ක් වෙන්දේසි කර ඇත. 2024 දෙසැම්බර් 31 දින වන විට වාහන 14 ක් අබලි තත්ත්වයේ පවතින අතර ඒ පිළිබඳව පිළිතුරෙහි සඳහන් නොවේ.	අබලි වාහන සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 අනාර්ථික ගණුදෙනු

විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් 2019 වර්ෂයේ රු. 39,374,087 ක් වැය කර පොළොන්නරුවේ, කොළඹ මඩකලපු මාර්ගය අසල ඉදි කර තිබූ කාමර 22 කින් සමන්විත වෙළඳසැල් සංකීර්ණයෙහි කඩ කාමර 3ක බදුකරුවන් තිදෙනෙකු වෙළඳ කටයුතු සිදු කරමින් පැවතුණි. එසේ වුවද එම බදුකරුවන් විසින් 2025 මාර්තු 06 දින දක්වා අරමුදල වෙත කිසිදු බදු මුදලක් ගෙවා නොතිබුන අතර මෙම ඉඩමේ භුක්තිය අරමුදල වෙත නොතිබීම හේතුවෙන් නෛතික බදු ගිවිසුම්වලට එළඹීමටද නොහැකි වී තිබුණි. තවද ඉතිරි කඩ කාමර 19 ද වසර 5 කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.	වර්තමානයේ මධ්‍යම සංස්කෘතික අරමුදල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අතර සාකච්ඡා වට කිහිපයක් පැවැත් වූ අතර මධ්‍යම සංස්කෘතික අරමුදලට රජයේ ඉඩම් සෘජුව පැවරීමට බලතල නොමැති නම් එය රේඛීය අමාත්‍යාංශය වෙත පවරා රේඛීය අමාත්‍යාංශය විසින් මධ්‍යම සංස්කෘතික අරමුදලට භුක්තිය භාරදීමට යෝජනා වී ඇත. ඒ අනුව ඉදිරියේ දි භුක්තිය ලබා ගැනීමෙන් පසු අදාළ ව්‍යාපාරිකයන් සමඟ ගිවිසුම්ගත වීමට නෛතික අයිතියක් හිමිවන අතර ඒ අනුව බදු කුලි අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.	ගොඩනැගිල්ල විධිමත්ව පවරා ගැනීමට කටයුතු කල යුතු අතර කඩ කාමර බදු දීමේදී විධිමත් ගිවිසුම් මත බදු දීම සිදුකල යුතුය.
(ආ) පොළොන්නරුව පිළිබඳ ප්‍රකාශිත සියළු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය තොරතුරු හා පැරණි ලේඛණගත තොරතුරු ඒකරාශී කෙරෙන ලේඛණාගාරයක් සහ පරිශීලකයන්ට අවශ්‍ය පහසුකම් සැලසීමේ අරමුණින් පොළොන්නරුව උරුම කළමනාකරණ මධ්‍යස්ථානයක් දින 180 ක් තුළ ඉදිකිරීමට මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම සමග රු. 38,926,902 ක ඇස්තමේන්තුගත මුදලකට 2019 මාර්තු 20 දින ගිවිසුම්ගත වී තිබුණද විවිධ හේතුන් මත දින දීර්ඝ කිරීම 2020 ජුනි 28 දින දක්වා ලබාදී තිබුණි. මෙම ඉදිකිරීම සඳහා 2018 වර්ෂයේ අත්තිකාරම් ලෙස රු.8,953,187ක් හා 2019 වර්ෂයේ රු.4,124,175 ක් ගෙවා තිබුණද ගොඩනැගිල්ලේ ඉදිකිරිම් කටයුතු අතර මඟ නවතා දමා තිබීම හේතුවෙන් එම වියදම නිෂ්කාර්ය වී තිබුණු අතර මෙම ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබූ ඉඩමේ අයිතිය පවරා ගැනිමට ද කටයුතු කර නොතිබුණි.	මෙම කොන්ත්‍රාත් කාර්යය අතරමග නැවත්වීමට හේතු වී ඇත්තේ 2019 වර්ෂයේ ඇති වූ පාස්කු ප්‍රහාරය හා කොරෝනා වසංගතය හේතුවෙන් මධ්‍යම සංස්කෘතික අරමුදල දැඩි මූල්‍ය අර්බුදයකට මුහුණ පෑම නිසාවෙනි. මේ අවස්ථාවේ දී සිදු කරමින් පැවති සියළු කොන්ත්‍රාත් කාර්යයන්ගේ ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් කොන්ත්‍රාත් කාර්යයන් සිදු කරගෙන යාම නැවති ඇත. මේ සම්බන්ධයෙන් මධ්‍යම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට දැනුම් දී ඇත.	ඉඩමේ අයිතිය පවරා ගෙන ඉදි කිරීම සම්පූර්ණ කර ගැනීම සඳහා කටයුතු කල යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) ශ්‍රී දළදා මාළිගාවේ ත්‍රිපිටක අඩංගු පුස්කොළ පොත් ඩිජිටල්කරණය හා	ශ්‍රී දළදා මාළිගාවේ ත්‍රිපිටක අඩංගු පුස්කොළපොත් ඩිජිටල්කරණය හා වාර්තාකරණය කාර්යය ඉටු කිරීම සඳහා පාලි භාෂාව ප්‍රගුණ කළ විද්වතෙකුගේ	කාර්යයන් සැලසුම් කිරීමේදි ඒ සඳහා අවශ්‍ය සම්පත් ලබා

වාර්තාකරණය සඳහා 2023 සහ 2024 වර්ෂයන්වල රු.2,412,500 ක ඇස්තමේන්තුගත මුදලින් රු.1,258,750 ක් වියදම් කර තිබුණද ඒ සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලබා ගන්නා ක්‍රමවේදය පළමුව තීරණය කර සැලසුම් කිරීම සිදුකර නොතිබීම සහ දියවඩන නිලමේතුමා සහ මහනායක හිමිවරුන් ඒ සඳහා එකඟතාවය ලබා දී නොමැති වීම හේතුවෙන් 2025 දෙසැම්බර් 31 දින වන විටත් ත්‍රිපිටක අඩංගු පුස්කොළ පොත් ඩිජිටල්කරණය යන කාර්ය අවසන් කර නොතිබුණි.	සේවය අවශ්‍ය වූ අතර ඒ සඳහා මහනුවර ව්‍යාපෘතියේ එවැනි විශේෂඥයෙකු විය. ඔහු ලවා මෙම කාර්යය අවසන් කිරිමට නියමිතව තිබුණ ද අදාල නිලධාරියා විශ්‍රාමයාම නිසා නතර විය. මෙම කාර්යය කරවා ගැනිමට යාමේ දී දියවඩන නිලමේතුමා සහ මහනායක හිමිවරුන් ඒ සඳහා එකඟතාවය ලබා දි නොමැත. එකගතාවය ලබා නොදිම ආයතනයේ පාලනයෙන් තොර කාර්යයක් නිසා උක්ත ප්‍රමාද කිරිම වී තිබේ . කෙසේ වෙතත් දැඩි පරිශ්‍රමයක් යොදා ස්වාමින් වහන්සේලා එකඟ කරවාගෙන මෙම කාර්යය වර්තමානයේ සිදු කරගෙන යනු ලැබේ.	ගැනීම සම්බන්ධව පූර්ව සැලසුම් පැවතිය යුතු අතර අදාල කාර්යයන් නිශ්චිත සැලසුමක් යටතේ අවසන් කිරීමට කටයුතු කල යුතුය.
(ආ) 2024 වර්ෂයේ සංචාරක මාර්ගෝපදේශ ග්‍රන්ථ සැකසීම වෙනුවෙන් රු.1,084,250 ක ඇස්තමේන්තුගත මුදලින් කම්කරු පිරිවැය ලෙස රු.26,300 ක් එනම් සියයට 3ක ප්‍රතිශතයක් පමණක් දරා තිබූ අතර සැලසුම් ප්‍රකාරව එම කාර්යය 2024 දෙසැම්බර් 31 ක දින වන විටත් අවසන් කිරීමට අරමුදල අපොහොසත් වී තිබුණි.	2024 වර්ෂයේ එම කාර්යය සඳහා ප්‍රතිපාදන වෙන් වුව ද මෙම කාර්යය යම් ප්‍රමාණයකට ඉටුකර තාවකාලිකව අත්හිටුවීම සිදු වී ඇත. මහාචාර්ය නිමල් ද සිල්වා මහතා විසින් මෙම ග්‍රන්ථය සකස් කර ඇති බැවින් නැවත සිදු කිරීමට අවශ්‍ය නොවන බව පසුකාලීනව තහවුරු වී ඇත. මේ වනවිට මහාචාර්ය නිමල් සිල්වා විසින් රචිත ග්‍රන්ථයේ කටයුතු කොළඹ පිහිටි අතපත්තු කාර්යාලයේ ප්‍රකාශන අංශය මගින් ඉටුකිරීමට පියවර ගෙන ඇත.	අවශ්‍යතාවය නිශ්චිතව තහවුරු කර ගැනීමෙන් පසුව ඇස්තමේන්තු සකස් කල යුතුය.
(ඇ) මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් ද්‍රව්‍ය සඳහා රු.43,942,030 ක් වැයකර ශ්‍රී ලංකා යුධ හමුදාවේ ශ්‍රමය ලබා ගනිමින් 2019 වර්ෂයේ දී ආරම්භ කරන ලද නෙල්ලිගල බෞද්ධ මධ්‍යස්ථානයේ විශ්‍රාම ශාලාවේ ඉදිකිරීම් 2020 වර්ෂයේ අතරමග නවතා දමන විට ප්‍රගතිය සියයට 40 ක් වී තිබුණි. විගණිත දිනය වූ 2025 දෙසැම්බර් 31 දින වන විටත් වසර 05 කට ආසන්න කාලයක් ගතවී පැවතුනද එම විශ්‍රාම ශාලාවේ ඉදිකිරීම්	මෙම කාර්යය ආරම්භ කර තිබුණ ද කොවිඩ් වසංගත තත්ත්වය හා පාස්කු ප්‍රහාරය හමුවේ මධ්‍යම සංස්කෘතික අරමුදල මුහුණු දුන් මූල්‍ය අර්බුදය හමුවේ මෙම කාර්යය අතරමග නතර විය. මේ පිළිබඳ සාකච්ඡා කර එය දැනට පවතින අයුරින් නා හිමි වෙත පැවරීමට යෝජනා කොට ඇත. නමුත් නා හිමි විසින් ඒ සඳහා යහපත් ප්‍රතිචාරයක් දක්වා නොමැත. මේ පිළිබඳව තවදුරටත් නා හිමි සමඟ සාකච්ඡා පවත්වමින් තිබෙන බව දන්වා තිබුණි.	විශ්‍රාම ශාලාවේ ඉදිකිරීම් පිළිබඳ අප්‍රමාදව සාකච්ඡා කර තීරණ ගත යුතුය.

කටයුතු අවසන් කර නොතිබුණි.		
(ඇ)නෙල්ලිගල විශ්‍රාම ශාලාව ඉදිකිරීමේ කටයුතු නතර කර වසර 05 කට ආසන්න කාලයක් ගතවී පැවතුනද, එම ව්‍යාපෘතිය වෙනුවෙන් රු.10,354,638 ක් වැය කර මිලදී ගන්නා ලද ඉදිකිරීම් උපකරණ අයිතම 11 ක් සහ පරිගණක හා උපාංග හා ප්‍රයෝජනයට ගත් පසු භාවිත තත්ත්වයේ පවතින භාණ්ඩ නැවත අරමුදල වෙත පවරා ගැනීමට හෝ ඒවා ආරක්ෂිතව භාරයේ තබා ගැනීමට අරමුදල විසින් කටයුතු කර නොතිබුණි.	2025 ජූලි 22 වන දින අභ්‍යන්තර විගණක ඇතුළු ත්‍රිපුද්ගල කමිටුවකගේ සහභාගීත්වයෙන් වැඩබිම පරීක්ෂා කර එහි එවකට පැවති සහ නොමැති භාණ්ඩ පිළිබඳව ලැයිස්තුවක් සකස් කර ඇත.එම ලැයිස්තුවේ ද්‍රව්‍ය නා හිමි වෙත භාර දීමට හෝ ව්‍යාපෘතිය වෙත භාර ගැනීමට යෝජනා කළ ද මේ සඳහා නා හිමිගේ එකඟතාව මෙතෙක් ලැබී නොමැත. ඒ පිළිබඳව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නා හිමි සමඟ සාකච්ඡා කරමින් පවතී.	විශ්‍රාම ශාලාවේ ඉදිකිරීම සඳහා මිලදී ගන්නා ලද උපකරණ හා පරිගණක උපාංග පිළිබඳ අප්‍රමාදව සාකච්ඡා කර තීරණ ගත යුතුය.
(ඉ)පොළොන්නරුව කෞතුකාගාරයේ වායු සමීකරණ පද්ධතියක් සවි කිරීම සඳහා 2024 අයවැය මඟින් රු.30,000,000 ක් වෙන් කර තිබුණද කෞතුකාගාරය තුළ වායු සමීකරණ පද්ධතියක් 2024 දෙසැම්බර් 31 දින තෙක් සවිකර නොතිබුණි. එබැවින් සංචාරකයින් අපහසුතාවයට පත්වන බව හා සංචාරකයින් ඒ පිළිබඳ අඛණ්ඩව පැමිණිලි කරන බව කෞතුකාගාරයේ පැමිණිලි ලේඛනය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.	එවකට ස්ථාපනය කර තිබූ වායු සමීකරණය පද්ධතිය අලුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් ඵලදායි නොවන බැවින් නව පද්ධතියක් ස්ථාපනය කිරීම තීරණය වී තිබුණි. ඒ සඳහා රු.30,000,000 ක් ප්‍රමාණවත් නොවන බැවින් 2026 වර්ෂයේ රු.71,554,328 ක මුදලක් වැඩ සැලැස්මට ඇතුලත් කර අනුමැතිය ලබා ගෙන ඇත.	ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමේදී අවශ්‍යතාවය නිවැරදිව හඳුනා ගෙන ඒ සඳහා ප්‍රමාණවත් පරිදි ඉල්ලීම් සිදු කල යුතු අතර, මිල විචලතාවයන්ට බලපෑමක් නොවන පරිදි අදාල කාලසීමාව තුල කාර්යය නිම කල යුතුය.
(ඊ) 2011 පෙබරවාරි 02 දිනැති අංක අමප /11/0/169/55/004 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අරමුදල උපයා ඇති ආදායමෙන් සියයට 25 ක් පුරාවිද්‍යා ස්ථාන පවත්වාගෙන යාම වෙනුවෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ලබා දිය යුතු වුවද 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වර්ෂ 6 ක් සඳහා ලබා දිය යුතු වූ එකතුව රු.3,233,773,978 ක් එම දෙපාර්තමේන්තුවට ලබා දී නොතිබුණි.	මෙම වර්ෂයන්හී මධ්‍යම සංස්කෘතික අරමුදලේ දැඩි වියදම් පාලනයක් සිදුකරමින් පවත්වාගෙන යන ලදි. මේ හේතුවෙන් එම වර්ෂවල පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් කරන ලද ඉල්ලීම් වලට අනුව සියයට 25 ක දායකත්ව මුදල ලබාදිය නොහැකි වී ඇත. 2025 වර්ෂයේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අවස්ථා 03 කදී රු.මිලියන 177.7 ක් ගෙවීම් කර තිබේ.	අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව කටයුතු කල යුතුය.

(උ) ශ්‍රී දළදා මාලිගාව ආසන්නයේ පිහිටි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් සංරක්ෂණ හා නඩත්තු කටයුතු හා භාවිතය සඳහා අරමුදලට ලබා දී තිබූ ජාත්‍යන්තර තොරතුරු මධ්‍යස්ථාන ගොඩනැඟිල්ල ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්ගේ ඉල්ලීම පරිදි 2017 ජූලි 23 සිට 2017 අගෝස්තු 16 දක්වා කාලය සඳහා මහනුවර ශ්‍රී පත්තිනි දේවාලයේ අවශ්‍යතා සඳහා භාර දී තිබුණි. එසේ වුවද එම ගොඩනැඟිල්ල ආපසු අරමුදලට භාර ගැනීමට 2025 මැයි 31 දින දක්වා පියවරගෙන නොතිබීම හේතුවෙන් මෙම ගොඩනැඟිල්ලේ පිහිටි තොරතුරු මධ්‍යස්ථානය වෙතින් ලබා දුන් දේශීය හා විදේශීය සංචාරකයන් වෙත නොමිලේ තොරතුරු ලබා දීම, නොමිලේ ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහන් පැවැත්වීම, සංස්කෘතිය හා බැඳුනු පොත් හා අනුරූ අලෙවි කිරීම, ශ්‍රී ලාංකීය සංස්කෘතිය සහ උරුමය හා බැඳුණු අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම යන සේවා වසර $4\ ^1/_2$ ක පමණ කාලයක් තිස්සේ ලබා දීමට නොහැකි වී තිබුණි. තවද අදාල ගොඩනැඟිල්ලේ පවතින මිලියන 05 කට අධික අරමුදලේ වත්කම්ද නිශ්කාර්යව හා ඌණ උපයෝජිතව පැවතුණි.	ජාත්‍යන්තර තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යාමට භාරගත් මෙම ගොඩනැගිල්ල 1991 වර්ෂයේ සිට 2017 ජූලි 23 දින දක්වා පවත්වාගෙන යන ලදී. මෙම ගොඩනැගිල්ල මධ්‍යම සංස්කෘතික අරමුදලට නීත්‍යානුකූල අයිතියක් නොමැති ගොඩනැගිල්ලකි. 2017 අගෝස්තු 10 වන දින දක්වා මෙම ගොඩනැගිල්ල ශ්‍රී මහා පත්තිනි දේවාලයේ 2017 වර්ෂයේ ඇසළ පෙරහැර කටයුතු සඳහා තාවකාලිකව භාවිතා කිරීමට පත්තිනි දේවාලයේ බස්නායක නිළමේවරයා වෙත අමාත්‍යාංශයේ නියෝගය පරිදි ලබාදීමට සිදුවිය. මෙම ගොඩනැගිල්ලෙහි යතුර මහනුවර පත්තිනි දේවාලයේ බස්නායකතුමා විසින් නැවත භාරදීම ප්‍රතික්ෂේප කරන අතර එසේම මෙම ගොඩනැගිල්ල තුළ මධ්‍යම සංස්කෘතික අරමුදලට අයත් දේපළ පවතී. එම භාණ්ඩ වලින් කොටසක් නැවත මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත ලබා ගෙන ඇත.	අමාත්‍යාංශය මගින් මෙම ගොඩනැගිල්ල නැවත ලබා ගෙන නීත්‍යානුකූලව අයිතිය පිළිබඳ පවත්නා ගැටලු නිරාකරණය කර ගැනීමට හා මධ්‍යස්ථානය මගින් ලබා දෙන ලද සේවාව ජනතාවට ලබා දීමට කටයුතු සැලැස්වීම අදාල පාර්ශවයන්ගේ වගකීම වන බව.
(ඌ) දුර්වල පාෂාණයකින් නිමවා තිබුණු අව්වැසි වලට නිරාවරණය වීම නිසා භෞතික හා රසායනික ජීරණයට ලක්ව බෙහෙවින් දුර්වල තත්ත්වයක පත්ව තිබූ බුදුරුවයාය සැතපෙන පිළිම වහන්සේ සඳහා පියස්සක් ඉදි කිරීමට ප්‍රමුඛ අවධානය යොමු කරන ලෙස දන්වා සංස්කෘතික අමාත්‍යාංශය විසින් මධ්‍යම	කොවිඩ් වසංගතය හමුවේ හා පාස්කු ප්‍රහාරය හමුවේ මුදල් තත්ත්වය අයහපත් වූ බැවින් මෙම කටයුතු ප්‍රමාද ව ඇත. ඉන් පසු මූල්‍ය තත්ත්වය යහපත් වීමෙන් අනතුරුව මෙහි ඉතිරි කටයුතු සඳහා ක්‍රියාත්මක වී ඇති අතර අංක 224 මාර්තු 04 පාලක මණ්ඩල පත්‍රිකා අනුමැතිය අනුව කොන්ත්‍රාත්කරු කර ඇති කාර්යයන්වල බිල්පත් ගෙවා කොන්ත්‍රාත්තුව අවසන් කිරීමත් ඉංජිනේරු උපදෙස් ලබාගෙන යෝජිත පියස්සේ සැලසුම සංශෝධනය කොට ඉදිකිරීමත් 2026 වර්ෂයේ අවසන් කිරීමටත් කටයුතු කර ඇත.	පුරාවිද්‍යා ස්මාරක වල ආරක්ෂාව සහ සංරක්ෂණය සඳහා ප්‍රමුඛ හා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය.

සංස්කෘතික අරමුදල වෙත උපදෙස් ලබා දී තිබුණි. ඒ අනුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් අනුමැතියෙන් පසුව 2019 නොවැම්බර් 04 දින බුදුරුවයාය සැතපෙන පිළිම වහන්සේ සඳහා පියස්සක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් පසු ලිඛිත ගිවිසුමකින් තොරව රු.1,941,433 ක වටිනාකමට දින 150 ක් තුල සම්පූර්ණ කිරීමට ඉදිකිරීම් ආයතනයට පිරිනමා තිබුණි. එසේ වුවද, විගණිත දිනය වූ 2024 ඔක්තෝබර් 06 වන විටත් රු.874,019 ක වටිනාකමක බිල්පත් ඉදිරිපත් වී තිබුණද කොන්ත්‍රාත්තුව සඳහා ගිවිසුමක් ඉදිරිපත් නොවීම හේතුවෙන් ගෙවීම් කටයුතු කිරීමට නොහැකි වීම මත ඉදිකිරීම් කටයුතු අසම්පූර්ණව නතර වී වසර 4 $^{1}/_{2}$ ක් ගතව තිබුණි.		
(එ) සිසු දහම් සෙවන තෙවන අදියරේ පැකේජ් A යටතේ දහම් පාසල් ගොඩනැගිලි 16 ක් පැකේජ b යටතේ දහම් පාසල් ගොඩනැගිලි 06 ක් සහ පැකේජ C යටතේ දහම් පාසල් ගොඩනැගිලි 04 ක් වශයෙන් දහම් පාසල් ගොඩනැගිලි 26 ක් ඉදිකිරීම සඳහා 2019 ඔක්තෝබර් 31 දින වැඩ අවසන් කිරීමේ පදනම මත ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව හා අරමුදල අතර දින හා වටිනාකම් රහිතව අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි. කෙසේ වෙතත් 2024 ජූනි 30 දින වන විටත් එම ගොඩනැගිලි ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය සියයට 65 ක් පමණක් වූ අතර, මෙම කාර්යය සඳහා අරමුදල විසින් සංස්ථාව වෙත අත්තිකාරම් ලෙස රු.33,600,000 ක මුදලක් 2019	සිසු දහම් සෙවන III අදියර A පැකේජය යටතේ ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාවට දහම් පාසල් ගොඩනැගිලි 16 භාර දී තිබිණ. 2019 ඔක්තෝබර් 30 පසු මෙම ඉදිකිරීම් සිදු කර නොමැත.මෙම ඉදිකිරීම් පිලිබඳ ගත යුතු ක්‍රියාමාර්ග පිලිබඳ ගරු අග්‍රාමාත්‍ය තුමියගේ මූලිකත්වයෙන් විමර්ෂණයක් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ත්‍රිපුද්ගල විමර්ෂණ කමිටුවක් පත් කෙරිණ. මේ වන විට විමර්ෂණ කටයුතු අවසන් වී ඇතත් අප ආයතනය වෙත විමර්ෂණ වාර්තාව ලැබී නොමැත. එම විමර්ෂණ වාර්තාවෙන් ලබාදෙන නිර්දේශ අනුව හා පාලක මණ්ඩලය විසින් ලබා දෙන නියෝග මත මෙම ඉදිකිරීම් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ.	විමර්ශන වාර්තාව අප්‍රමාදව ලබා ගෙන එම නිර්දේශ අනුව කඩිනමින් කටයුතු කල යුතුය.

සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසවලදී ගෙවා තිබුණ ද අපේක්ෂිත පරමාර්ථ ඉටුකරගෙන නොතිබුණි.		
(ඒ) සිසු දහම් සෙවන තෙවන අදියර පැකේජ A යටතේ දහම් පාසල් ගොඩනැගිලි 28 ක් පැකේජ b යටතේ දහම් පාසල් ගොඩනැගිලි 32 ක් හා පැකේජ C යටතේ දහම් පාසල් ගොඩනැගිලි 28 ක් වශයෙන් දහම් පාසල් ගොඩනැගිලි 88 ක් ඉදිකිරීම් සඳහා 2019 ඔක්තෝම්බර් 31 දින වැඩ අවසන් කිරීමේ පදනම මත රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව හා අරමුදල අතර දින හා වටිනාකම් රහිතව අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි. කෙසේ වෙතත් 2024 ජුනි 30 දින වන විටත් ඉන් දහම් පාසල් ගොඩනැගිලි 20 ක වැඩ ආරම්භ කර නොතිබුණි. වැඩ ආරම්භ කර තිබූ දහම් පාසල් ගොඩනැගිලි 68 ක භෞතික ප්‍රගතිය සියයට 10 ත් 23 ත් අතර විය. කෙසේ වුවද මෙම දහම් පාසල් ගොඩනැගිලි ඉදිකිරීම වෙනුවෙන් අත්තිකාරම් ලෙස සංස්ථාව වෙත රු. 21,800,000 ක් අරමුදල විසින් 2019 සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසවලදී ගෙවා තිබුණ ද වැඩ අවසන් කර ගැනීමට පාලනාධිකාරිය කටයුතු කර නොතිබුණි.	2020ට පෙර සිදු කරන ලද ඉදිකිරීම් හා වෙනත් සංස්කෘතික ක්‍රියාකාරකම් යටතේ සිදු කරන ලද ගෙවීම් සම්බන්ධයෙන් කරුණු සොයා බැලීමට අමාත්‍ය මණ්ඩලය විසින් ත්‍රි පුද්ගල කමිටුවක් පත් කර විමර්ෂණ කටයුතු ආරම්භ කරන ලදි.මේ වන විට එම විමර්ෂණ කටයුතු අවසන් වී ඇතත් මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත විමර්ෂණ වාර්තාව ලැබී නොමැති අතර විමර්ෂණ වාර්තාව පදනම් කරගෙන පාලක මණ්ඩලය විසින් ලබාදෙන උපදෙස් අනුව මෙම දහම් පාසල් ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ.	විමර්ශන වාර්තාව අප්‍රමාදව ලබා ගෙන එම නිර්දේශ අනුව කඩිනමින් කටයුතු කල යුතුය.
(ඔ) අරමුදලේ රු. 100,000,000 ක මුදලක් ආයෝජනය කිරීමට අදාළව කොල්ලුපිටිය ලංකා බැංකු ප්‍රධාන කළමනාකරු විසින් එවා තිබූ ලිපියෙහි සඳහන් පොලී අනුපාත සාවද්‍ය ලෙස වෙනස් කිරීමට කටයුතු කර තිබුණද මේ පිළිබඳ විමර්ශනයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් හඳුනාගැනීමට 2025 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.	ඉහත සිදුවීම සම්බන්ධයෙන් ආයතනයේ අභ්‍යන්තර විගණක විසින් පරීක්ෂාකර 2024 මාර්තු 06 දින ඔහුගේ විගණන වාර්තාව ඉදිරිපත් කර ඇත. පසුව ඉදිරියේදී අපක්ෂපාතී හා සාධාරණ අයුරින් විමර්ශනයක් කිරීම සඳහා අමාත්‍යාංශය වෙත 2024 අප්‍රේල් 30 දිනැතිව ලිපියක් මඟින් මූලික විමර්ශනයක් සිදු කරන ලෙස ඉල්ලීමක් කර තිබුණි. ආයතනයේ විනය කාර්යය පටිපාටිය අනුව අභ්‍යන්තර විමර්ශනයක් ආරම්භ කිරීමට පියවර ගෙන ඇත.	විමර්ශන කඩිනමින් අවසන් කර වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධ ක්‍රියාමාර්ග ගත යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මධ්‍යම සංස්කෘතික අරමුදලේ සංවර්ධන කටයුතු වාස්තු විද්‍යා සංරක්ෂණය, බිතු සිතුවම් සංරක්ෂණය, පුරාවිද්‍යා පර්යේෂණ හා කැනීම් සහ කෞතුකාගාර කටයුතු යන අංශ 04 ක් යටතේ සිදු කරනු ලබන අතර ඒ සඳහා ව්‍යාපෘති තෝරා ගැනීම, අනුමැතිය ලබාගැනීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අනුමත ක්‍රියාපටිපාටියක් හෙවත් මාර්ගෝපදේශ සංග්‍රහයක් හඳුන්වා දී නොතිබුණි.	ව්‍යාපෘතීන් තෝරා ගැනීම සඳහා ක්‍රියා පටිපාටිය පහත පරිදි වේ. 1. මුදල් උත්පාදනය කරනු ලබන අනුරාධපුරය, සීගිරිය, මොණරාගල, යාපනය, පොළොන්නරුව යන ස්ථානවලින් ලැබෙන ආදායමින් කොටසක් පුරාවිද්‍යා හා සංරක්ෂණ කාර්යයන් සඳහා යොදවනු ලැබේ. 2. අනුරාධපුරය, සීගිරිය, දඹුල්ල, ගාල්ල හා මහනුවර යන ස්ථානවල කෞතුකාගාරවල තත්ත්වය ඉහළ මට්ටමින් නඩත්තු කර පවත්වාගෙන යාම. 3. වයඹ, ඌව, මාතර, තිස්සමහාරාමය, රම්බා විහාරය වැනි ජාතික වශයෙන් වැදගත්කමක් ඇති පුරාවිද්‍යාත්මක කටයුතු. 4. මීට අමතරව ලංකාවේ වෙනත් ප්‍රදේශවලින් ලැබෙන ඉල්ලීම්වලින් ඉතා ඉක්මණින් මැදිහත් වීමට අවශ්‍යවන ස්ථාන. එබැවින් ඉහත මාර්ගෝපදේශ භාවිතා කරමින් පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ක්‍රියා කිරීම මධ්‍යම සංස්කෘතික අරමුදලේ සාමාන්‍ය ක්‍රියාපටිපාටිය වේ.	ව්‍යාපෘති තෝරා ගැනීම් පිළිබද විධිමත් නිර්ණායක සහිත ලිඛිත මාර්ගෝපදේශ පවත්වා ගත යුතුය.
(ආ)	මධ්‍යම සංස්කෘතික අරමුදලේ මහනුවර ව්‍යාපෘති කාර්යාලයේ 2023 සහ 2024 වර්ෂයන්හි සැලසුම් ගත කාර්යයන් 07 ක භෞතික ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස සියයට 03 සිට සියයට 59 දක්වා අඩු මට්ටමක පැවතුණු අතර ගඩලාදෙණිය විජයෝත්පාය කුඩා විහාර සඳහා වහල සංරක්ෂණ කාර්යයේ ප්‍රගතිය ශූන්‍ය බවද නිරීක්ෂණය විය.	මහනුවර ව්‍යාපෘතියේ මාර්ගෝපදේශ ග්‍රන්ථය සැකසීමේ කාර්යයෙහි මූලික කටයුතු සිදුකර ඉතිරි කාර්යය සඳහා ප්‍රවාහන පහසුකම් සලසා ගැනීමට නොහැකි වූ හෙයින් සිදු කර ගැනීමට නොහැකි විය. ගඩලාදෙණිය විජයෝත්පාය කුඩා විහාර සඳහා වහල සංරක්ෂණය කාර්යය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් ලබා දුන් සැලසුම්වල ගැටලුකාරී තත්ත්වයක් වූ නිසා ප්‍රගතිය අඩු වී ඇත. දළදා මාලිගා පරිශ්‍රයේ සිතුවම් වාර්තාකරණය අප ආයතනය සතුව ඇති වැඩ බිමක් නොවන හෙයින් එම කටයුතු සිදු කර ගැනීම සඳහා මහානායක ස්වාමීන් වහන්සේලා හා දියවඩන නිලමේතුමාගේ අවසරය පරිදි සිදු විය යුතු ය.	සම්පත් ලබා ගැනිම හා නෛතික තත්වයන් පිළිබඳ සලකා බලා සැලසුම් සකස් කිරීම කල යුතුය.

		අධිආරක්ෂක කලාපයක පිහිටි හෙයින් ද අධීක්ෂණ කටයුතු ද සිදු කරන බැවින් ඉලක්ක ගත ප්‍රමාණය ළඟා කර ගැනීමට නොහැකි බව දන්වා තිබුණි.	
(ඇ)	වාස්තු විද්‍යා ස්මාරක සංරක්ෂණ කටයුතු සිදු කිරීමේදී වටිනා දැව සහිත වහල, කැටයම් සහිත ලී කණු ඇතුළත් ස්මාරකයන්හි සංරක්ෂණ කටයුතුවලදී පෙර භාවිතා කර තිබූ වටිනා දැව හා අනෙකුත් ද්‍රව්‍යයන්වලින් ප්‍රයෝජනයට ගත හැකි ද්‍රව්‍ය නැවත භාවිතා කර දිරාපත් වූ විනාශයට පත් වූ දැව හා අනෙකුත් ද්‍රව්‍යයන් ඉවත් කිරීම සිදුකර තිබුණි. නමුත් ව්‍යාපෘති වැඩබිම් බාර ගැනීමේදී, අරමුදල වෙත පවරාගන්නා වටිනාකමින් යුත් දැව හා ද්‍රව්‍යයන්ගේ විස්තර ඇතුළත් කරන ලද ලේඛනයක් සහ සංරක්ෂණ කටයුතු වලදී ඉවත් කරනු ලබන හෝ වැඩබිම්වල හිමිකාරත්වය වෙත නැවත පැවරීම සිදුකරන දැව හා ද්‍රව්‍යයන් පිළිබඳව විස්තර ඇතුළත් කරන ලද භාණ්ඩ වට්ටෝරු ලේඛනයක් නඩත්තු කිරීම සිදු කර නොතිබුණි.	සංරක්ෂණයේදී ස්මාරකවලින් ගලවනු ලබන ලී ආදිය බොහෝ විට නැවත භාවිත කළ නොහැකි මට්ටමක පවතී. එවැනි අවස්ථා නිරීක්ෂණය වීමෙන් පසු නිසි ආකාරයට දැනුම් දෙන ලෙසට දන්වා ඇත. එම ලිපියේ පිටපතක් කාරුණික අවධානය පිණිස මේ සමඟ ඉදිරිපත් කරමි. කෙසේ වෙතත් මේ සම්බන්ධව විධිමත් වූ උපදෙස් මාලාවක් ව්‍යාපෘති කළමණාකරවරුන්, ස්ථානභාර නිළධාරීන්, ගිණුම් නිළධාරීන් හා වැඩබිම් නිළධාරීන් වෙත ලබාදීමට කටයුතු කරන ලදී.	වැඩ බිම් වල ඉවතලන ද්‍රව්‍ය හා උපකරණ සඳහා නිසි ලේඛණගත ක්‍රමවේදයන් ක්‍රියාත්මක කල යුතුය.
(ඈ)	ව්‍යාපෘතිවල තොග ගබඩාව විසින් පොදු තොග පොතෙන් එක් එක් වැඩබිම වෙත ද්‍රව්‍ය නිකුත් කලද එක් එක් වැඩ බිම සඳහා වෙන් වෙන්ව තොග පොත් හෝ ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි.	වැඩබිම වෙත ද්‍රව්‍ය නිකුත් කිරීමේදී තොග පොත්වලට ඇතුළත් කරනු ලැබූ විගසම එක් එක් වැඩබිම්වලට වෙන වෙනම ලේඛනයක් පවත්වාගෙන යාම සඳහා උපදෙස් ලබා දී තිබේ.	එක් එක් වැඩබිම්වල ද්‍රව්‍ය ඇතුලත් කිරීම සඳහා වෙන වෙනම ලේඛන පවත්වා ගත යුතුය.
(ඉ)	දඹුල්ල බිතුසිතුවම් කෞතුකාගාරයේ වහලය අලුත්වැඩියාව 2024 මාර්තු මාසයේ ආරම්භ කර ජූනි වන විට අවසන් කළ බවට වියදම් වාර්තා හා මාසික ප්‍රගති වාර්තා අනුව දක්වා තිබුණි. ඒ සඳහා අදාල ද්‍රව්‍ය භාවිතා කර මාස 02 ක් ඉක්මවූ පසු ද්‍රව්‍ය ඉල්ලුම්පත් එනම් 2024 මැයි 03 දින ගබඩාවට භාරදී තිබූ අතර එම ද්‍රව්‍ය ඉල්ලුම්පත්‍රවල ගබඩාවෙන් ද්‍රව්‍ය නිකුත්කල ප්‍රමාණය සටහන් කර නොතිබීම	ව්‍යාපෘති කළමණාකරුවන්ගේ හා ගිණුම් නිළධාරීන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ ව්‍යාපෘති ගබඩා පවත්වාගෙන යාම හා කළමනාකරනය සම්බන්ධයෙන් පොදු උපදෙස් මාලාවක් ව්‍යාපෘති වෙත නිකුත් කර ඒ අනුව කටයුතු කරගෙන යාමට සියලු නිළධාරීන් දැනුවත් කර තිබේ. එසේ නියමිත ක්‍රමවේදයන්ගෙන් බැහැරව ක්‍රියා නොකෙරෙන අවස්ථා වාර්තා වූ විට ඒ සම්බන්ධයෙන් විනයානුකූලව ක්‍රියා කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන බව දන්වා තිබුණි.	ගබඩා පරිපාලනය නිසි ක්‍රමවේදයකට අනුව සිදු විය යුතු අතර අදාල ලේඛනගත කිරීම් නිවැරදිව සහ විධිමත්ව සිදු කල යුතුය.

	හා නිකුත් කල ද්‍රව්‍ය ප්‍රමාණය භාවිතයට ගෙන නොතිබූ අතර විගණිත දිනය වූ 2025 ජනවාරි 27 දින වන විට කාර්ය අවසන් වී මාස 7 කට ආසන්න කාලයක් ගතවී ඇතත් ඉතිරි ද්‍රව්‍ය ගබඩාවට භාර නොදීම හේතුවෙන් තොග ලේඛනවලටද ගැනීමට කටයුතු කර නොතිබුණි.		
(ඊ)	සීගිරිය ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු සකස් කර මුල් අවස්ථාවේම අදාල වැඩබිම් සඳහා ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීමට කටයුතු කරන බවත් එලෙස මිලදී ගත් ද්‍රව්‍ය හා උපකරණ 2021 වර්ෂයේ සිට මේ දක්වා තොග ගබඩාවෙන් නිකුත් කරමින් පවත්නා බවත් නිරීක්ෂණය විය. විගණිත දිනය වූ 2025 පෙබරවාරි 05 වන විට එකතුව රු. 2,561,900 ක් වූ ගොඩනැගිලි ද්‍රව්‍ය, ජලනල උපකරණ, විදුලි උපකරණ, යකඩ ද්‍රව්‍ය හා වෙනත් ද්‍රව්‍ය තොග සෙමෙන් චලනය වෙමින් පැවතුණි. මෙසේ පැවතීම තුල කල් ඉකුත් වීම නිසා භාවිතයට ගැනීමට නොහැකි තොගද පැවතිය හැකි බව නිරීක්ෂණය විය.	2024 වාර්ෂික තොග සමීක්ෂණ වාර්තාවන්හී ඇතුළත් රුපියල් මිලියන 2.5 ක අගයක් ගන්නා තොග සියල්ලක්ම දෙස් විදෙස් සංචාරක ආකර්ෂණීය ලෝක උරුම පුරාවිද්‍යාත්මක පරිශ්‍රයක් වන සීගිරිය ව්‍යාපෘතියේ පොදු පහසුකම් සැපයීමට හා දෛනික නඩත්තු කටයුතු පවත්වාගෙන යාම පිණිස අත්‍යාවශ්‍ය තොග අයිතමයන් වන බව දන්වා තිබුණි.	අවශ්‍යතාවය අනුව තොග රැස්කර අපතය වලක්වා ගැනීමට කටයුතු කල යුතුය.

3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	**කළමනාකරණයේ අදහස් දැක්වීම**	නිර්දේශය
2024 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබූ නමුත් වර්ෂය ආරම්භ වීමට ප්‍රථම පාලක මණ්ඩල අනුමැතිය ලබාගත යුතු වුවත් ඒ සඳහා වර්ෂය ආරම්භ වී මාස 06 ක් ඉක්මවූ පසු එනම් 2024 ජුනි 18 දින පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි. තවද 2024 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අදාල 2024 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණි.	2024 ප්‍රසම්පාදන සැලැස්ම පාලක මණ්ඩලය වෙත වර්ෂයේ පළමු රැස්වීම 2024 මාර්තු 21 දින පාලක මණ්ඩල පත්‍රිකා අංක 218 යටතේ ඉදිරිපත් කර ඇත. නමුත්, එදින එය සාකච්ඡාවට ගෙන නොමැත. ඉන් අනතුරුව 2025 මැයි 17 දින පැවැති පාලක මණ්ඩල මගින් පත්‍රිකා අංක 219 යටතේ අනුමත කර ඇත. මෙම වර්ෂයේ පාලක මණ්ඩල රැස්වී ඇත්තේ ඉහත සඳහන් දිනවලදීය.	චක්‍රලේඛ ප්‍රකාරව නියමිත කාලය තුල ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර අනුමැතිය ලබා ගත යුතුය. තවද සැලැස්මට අදාල ප්‍රගතියද පිළියෙල කල යුතුය.

4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය.

4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම.

විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 877 (ඉ) ඡේදය ප්‍රකාරව සියලු ගණන්දීමේ නිලධාරීන් විසින්, අරමුදලේ මූල්‍ය වාර්තා හා කාර්යසාධන වාර්තා විගණනය කර විගණකාධිපති විසින් ලබා දෙන විගණන වාර්තා ද ඇතුලත් කරමින් වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වීමෙන් දින 150 ක් ගතවීමට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වුවද 2018 වර්ෂයේ සිට 2020 දක්වා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඇතුලත් කාර්යසාධන වාර්තා 2026 පෙබරවාරි 28 දින වන විටත් සභාගත කර නොතිබුණි.	2018 වර්ෂයේ වාර්ෂික වාර්තා දැනටමත් සම්පූර්ණ කර අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගෙන ඇත. එය භාෂා පරිවර්තන කාර්යය සඳහා යොමු කර ඇත. 2019 වර්ෂයේ වාර්ෂික වාර්තා පිළියෙල කර ඇති අතර එය මෙම මස අවසානයේ සම්පූර්ණ කර අමාත්‍යාංශ අනුමැතිය සඳහා යොමු කළ හැකි බව දන්වා තිබුණි.	මුදල් වර්ෂය අවසන් වීමෙන් දින 150 ක් ගතවීමට පෙර සභාගත කල යුතුය.

4.2 අයවැය පාලනය

	විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිදෙර්ශය
(අ)	7406 - යටිතල පහසුකම් සංවර්ධනය (කොන්ත්‍රාත් පදනම මත) හා 7407 සංරක්ෂණය (කොන්ත්‍රාත් පදනම සඳහා) යන ලෙජර් කේත යටතේ 2024 වර්ෂයේ පිලිවෙලින් රු.100,000,000 හා රු.400,000,000 ක් වෙන් කර තිබුනද 7406 ලෙජර් කේතය යටතේ කිසිදු වියදමක් දරා නොතිබුණු අතර රු.400,000,000 ක ලෙජර් කේතයෙන් රු. 18,790,822 ක් එනම් සියයට 4 ක් පමණක් වියදම් දරා තිබුණි. ඒ අනුව මෙම ලෙජර් කේත සඳහා අධි ඇස්තමේන්තු සකසා ඇති බව නිරීක්ෂණය වූ අතර 2024 අයවැය මගින් ලෙජර් ගිණුම් 14 ක් සඳහා රු.174,600,000 වෙන්කර ඇතත් 2024 වර්ෂය තුළ කිසිදු වියදමක් දරා නොතිබුණි.	ප්‍රතිපාදන වෙන්කර නමුත් වියදම්ව නැති වැය ශීර්ෂ වෙනුවෙන් ව්‍යාපෘති සහ ප්‍රධාන කාර්යාල අංශ විසින් වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම හේතුවෙන් මෙම ලෙජර කේත සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම් සිදුකර ඇත. ඉදිරියේදී මේ සම්බන්ධව සියලු ව්‍යාපෘති සහ ප්‍රධාන කාර්යාලීය අංශ දැනුවත් කර වාර්ෂික අයවැය පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ.	තත්‍ය වියදම් පදනම් කරගෙන අවශ්‍යතා සලකා බලා ඇස්තමේන්තු සකස් කල යුතුය.
(ආ)	2024 වර්ෂය තුළ අරමුදලේ ව්‍යාපෘතින් හි පුරාවිද්‍යා පර්යේෂණ කැණීම් කටයුතු , සංරක්ෂණ කටයුතු , කෞතුකාගාර හා පුරාවිද්‍යා ස්ථාන	2024 වර්ෂය සඳහා යෝජනාවලින් සකස් කරනු ලැබුවේ 2023 වර්ෂයේදීය.	ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී

	නඩත්තුව වෙනුවෙන් මූලිකව රු. 751,985,727 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණ ද වර්ෂය තුලදි එය රු.745,696,253 ක් දක්වා අඩුකර සංශෝධනය කර තිබුණි.මෙලෙස 2022, 2023 වර්ෂයන්ගේද ඇස්තමේන්තු පිළියෙල කර පසුව සංශෝධිත ඇස්තමේන්තු පිළියෙල කර ඇති බව නිරීක්ෂණය වූ අතර තවද සංශෝධිත ඇස්තමේන්තුවේ සත්‍ය වැඩ වටිනාකම රු.362,654,422 ක් වූ අතර එහි ප්‍රගතිය මූලික ඇස්තමේන්තුව සමඟ සැසදීමේදී සියයට 52 ක මට්ටමක් පැවතුණි. ඒ අනුව පවත්නා තත්ත්වය පදනම් කරගෙන ඇස්තමේන්තු සැකසීම සිදුකර නොමැති බව නිරීක්ෂණය විය. තවද 2024 වර්ෂය තුළ සිදු කිරීමට අපේක්ෂා කළ මොණරාගල හා මඩකලපු ව්‍යාපෘතිවල ප්‍රගතිය සියයට 50 කටත් වඩා අඩු මට්ටමක පැවතුණි.	ව්‍යාපෘතිවලින් යෝජනා සකස් කරනු ලබන්නේ ව්‍යාපෘති අවශ්‍යතා පදනම් කරගෙනය. එහිදී එම කාර්යය ඉටු කිරීමට ශ්‍රම සම්පත් ලබා ගැනීමට අපේක්ෂා කළද විවිධ හේතූන් මත මිනිස් ශ්‍රමය ලබා ගැනීමේ දුෂ්කරතා මතුව ඇත. 2024 වර්ෂයේ අවසානය වන විට මෙම දුෂ්කරතා මඟහරවාගෙන අත්‍යාවශය කාර්යයන් සඳහා දිස්ත්‍රික් මිළ පදනම යටතේ සේවකයින් ලබා දී ඇති අතර, අතපසු වූ කාර්යයන් කිහිපයක්ම ඉටුකර ගැනීමට හැකිවී ඇත.	පවතින සම්පත් හා අවශ්‍ය සම්පත් පිළිබඳ සැලසුම්ද සකස් කල යුතුය.
(ඇ)	වැලිහිඳ ශ්‍රී සුදර්ශනාරාමය බිතුසිතුවම් සංරක්ෂණය සඳහා මූලික ඇස්තමේන්තුව අනුව මිනිස් දින ගණන 1285, සංශෝධිත ඇස්තමේන්තුව අනුව මිනිස් දින ගණන 768 ක් හා සත්‍ය වශයෙන් ගතකර තිබූ මිනිස් දින ගණන 621 ක් විය. ඒ අනුව මූලික ඇස්තමේන්තුවේ සඳහන් මිනිස් දින ගණනින් සියයට 50 ක පමණ ප්‍රමාණයක මිනිස් දින ගණනක් පමණක් වර්ෂය තුළ සත්‍ය වශයෙන් ගතකර තිබූ බැවින් ව්‍යාපෘතිය සඳහා අධි ඇස්තමේන්තු සකස් කර විශාල කාලයකට ව්‍යාපෘතිය සැලසුම් කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය නිම කිරීමට වැඩිපුර කාලයක් ගතකිරීම සඳහා ව්‍යාපෘති කාලය අසාමාන්‍ය පරිදි දික්කර තිබූ බව විගණනයේ දී නිරීක්ෂණය විය.	විගණන විමසුමෙන් පෙන්වා දී ඇති පරිදි ඇස්තමේන්තු නිවැරදිව සකස් කිරීමට අවවාද කර ලිපි යොමු කර ඇත. විනයානුකූලව කටයුතු කිරීමට ද නියමිත ය. මෙම ඇස්තමේන්තු සංශෝධනය කිරීමෙන් අනතුරුව භෞතික ප්‍රගතිය සියයට 99 හා මූල්‍ය ප්‍රගතිය සියයට 62 ක් වශයෙන් වාර්තා කොට ඇත.	සත්‍ය වශයෙන් වැය වන දින පදනම් කර ගෙන ඇස්තමේන්තු සැකසිය යුතුය.

05. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අරමුදලේ ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ පුරප්පාඩු තනතුරු 7 ක් කොන්ත්‍රාත්, ද්විතීයික සහ වැඩ බැලීමේ පදනම මත සේවයේ යොදවා ගැනීම හේතුවෙන් අරමුදලේ අරමුණු කරා ලඟා වීමට හා දිගුකාලීන සැලැස්මක් ඇතිව අරමුදල මෙහෙයවීමට බාධාවක් විය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අවශ්‍ය සේවක පිරිස අනුමත කිරීමෙන් පසුව අප විසින් පුරප්පාඩු සහිත ඉහළ තනතුරු බඳවා ගැනීම් සඳහා 2025 දෙසැම්බර් 15 දින පුවත්පත් දැන්වීමක් පල කර අයදුම්පත් කැඳවා ඇති අතර, නුදුරු දිනයකදී එම තනතුරු සඳහා ස්ථිර නිලධාරීන් වශයෙන් පුරප්පාඩු පිරවීමට හැකියාව ලැබී ඇත.	බඳවා ගැනීමේ පටිපාටි අනුව නිලධාරීන් බඳවා ගත යුතුය.

(ආ)	දීර්ඝ කාලයක් කොන්ත්‍රාත් පදනම මත සේවකයින් බඳවා ගෙන කටයුතු කිරීමෙන් අදාල සේවකයන් විසින් තනතුරේ වැඩ ආවරණය කිරීමක් පමණක් සිදු කරන අතර අදාල තනතුරේ විෂය කටයුතු පිළිබඳ වගකීම් භාර ගැනීමක් සිදු නොවන අතරම මේ වන විට ප්‍රධාන කාර්යාලයේ නිලධාරින් 41 ක් එලෙස වැඩ ආවරණ කිරීම සිදු කරන බවද නිරීක්ෂණය විය.	කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුව විසින් ආයතනයට අවශ්‍ය සේවක සංඛ්‍යාව ඉල්ලුම් කර තිබුනද ඔවුන් විසින් අනුමත කර නොතිබිණි. එම නිසා ආයතනයේ එදිනෙදා කටයුතු ඉටු කර ගැනීමට කොන්ත්‍රාත් පදනම මත සේවකයින් යොදවා ගැනීමට සිදු විය.	කොන්ත්‍රත් තනතුරට අදාළ විෂයන් පිළිබඳ වගකීම දැරිය යුතු නිලධාරින් තිරණය කල යුතුය.
(ඇ)	අරමුදල යටතේ ව්‍යාපෘති 26 ක් ක්‍රියාත්මක වුවද එම එක් එක් ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වන සේවක සංඛ්‍යාව තීරණය කර නොතිබූ අතර අනුමත කාර්ය මණ්ඩලයක් නොමැති වීම හේතුවෙන් ව්‍යාපෘතිවල කාර්යමණ්ඩල අතිරික්ත හා ඌනතා හඳුනාගත නොහැකි බව නිරීක්ෂණය විය.	අප විසින් ව්‍යාපෘතීන්ට අදාල සේවක මණ්ඩලය තීරණය කර තිබුණද රජයේ සේවකයින් බඳවා ගැනීම තාවකාලිකව කාලයක් තිස්සේ නවත්වා තිබූ හෙයින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ආයතනයට අවශ්‍ය සේවක සංඛ්‍යාව ඉල්ලුම් කර තිබුනද ඔවුන් විසින් අනුමත කර නොතිබුන බව දන්වා තිබුණි.	ප්‍රාදේශිය කාර්යාල වල කාර්යයන් සලකා බලා අවශ්‍ය තනතුරු හා නිලධාරීන් සංඛ්‍යාව තිරණය කල යුතුය.